# කෘෂි නිෂ්පාදන මිලදී ගැනීම සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ගැටලු (කෑගල්ල දිස්ත්‍රික්කය ඇසුරින්)

එච්.ඒ.එස් සාරංග හෙට්ටිආරච්චි[1]

**සංක්ෂේපය**

කෘෂි නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලිය තුළ වගා කිරීමේදීත්, නිෂ්පාදන අලෙවි කිරීමේදීත්, පරිභෝජනය කිරීමේදිත් යම් යම් ගැටලු උද්ගත කරන බව එදිනෙදා සාකච්ඡාවන්හීදී වාර්තා වේ. විශේෂයෙන්ම වී අලෙවි කිරීමේදී ගොවියාත් සහල් මිලදී ගැනීමේදී පාරිභෝගිකයාත් විවිධ ගැටලුවලට මුහුණ දෙයි. එනම් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම තුළ ඒවා එකිනෙකට නොගැලපෙන බව පූර්ව පර්යේෂණ තුළින් අනාවරණය කර ඇත. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වූයේ රාජ්‍ය අංශයෙන් වී මිලට ගැනීමේ ප්‍රතිපත්තියක් රටේ ක්‍රියාත්මක වුව ද සහල් පරිභෝජනයේදී ජනතාවට ගැටලු උද්ගත කරනු ලබන්නේද? එසේනම් ඒ මොනවාද යන්න හඳුනා ගැනීමයි. එහිදී පාරිභෝගික ජනතාවගේ ගැටලු අධ්‍යයනය කිරීම සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ 103 බී මාපිටිගම වසම යොදා ගැණිනි. අධ්‍යයනයේ නියැදි ඒකක දෙක සදහා අහඹු ලෙස තෝරාගත් පවුල් සියයක් ඇතුළත් වූ අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත සහ තොරතුරු සපයා ගැණිනි. එමෙන්ම ලබා ගත් ඇතැම් තොරතුරු නිරීක්ෂණ මගින් මෙන්ම මූලික තොරතුරු සපයන්නන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා තුළින් තහවුරු කර ගැණිනි. සහල් මිලදී ගැනිමේ රාජ්‍ය ප්‍රතිපත්තියේ පවතින ගැටලු රාශියක් අධ්‍යයනයෙන් අනාවරණය විය. ඒ අතර ප්‍රධාන වශයෙන් සහල් මිලදී ගැනිමේ දී පාරිභෝගිකයාට ගුණාත්මක තත්ත්වයේ සහල් අඩු මිලකට වෙළඳපොළ තුළින් ලබාගත නොහැකි වීමයි (67.2%). විශේෂයෙන්ම සහල් නිෂ්පාදනය කරන රටක් වුවද මෙලෙස සහල් මිලදී ගැනීමේ දී විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බවත්, එකම සහල් වර්ගය වුවද එකිනෙකට මිල වෙනස්වන බවත් (27.8%). ඒ නිසා පාරිභෝගිකයන් ගැටලු නිසා සහල් මිලදී ගැනීමේ දී ක්‍රියාත්මක වන රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ සමාන ඉඩ ප්‍රස්ථා සියලු පාරිභෝගිකයන්ට නොමැති බව හඳුනා ගත හැකිය.

**මුඛ්‍ය පද :** *සහල් පරිභෝජනය, රාජ්‍ය ප්‍රතිපත්තිය, කෑගල්ල දිස්ත්‍රික්කය, පාරිභෝගිකයන්*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය,
damayanthi@kln.ac.lk